රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
Ministry of Public Administration and Management
ආයතන අංශය
தாபனப் பிரிவு
Establishments Division
නිදහස් චතුරස්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence Square, Colombo 07.
දුරකථන / தொலைபேசி : 011-2696211-13 / Telephone
ෆැක්ස් / பெக்ஸ் : 011-2692158 / Fax
ඊ-මේල් / ஈ-மெயில் : dge@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையதளம் : www.pubad.gov.lk / Website

| මගේ අංකය / எனது இல : / My No | EST/7/ALLOW/05/0029 | ඔබේ අංකය / உமது இல : / Your No | MA/MS/L/04/2014 | දිනය / திகதி : / Date | 2017.06.08 |
|---|---|---|---|---|---|

ලේකම්
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

**<u>සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සේවාස්ථ පුහුණු පාඨමාලා සඳහා ගෙවනු ලබන දීමනා සංශෝධනය කර ගැනීම</u>**

2017.05.03 වන දින ඔබ හා පැවති දුරකතන සාකච්ඡාව හා බැඳේ.

02. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සැලකිල්ලට ගෙන, මගේ සමාංක හා 2016.01.18 දිනැති ලිපියෙන් දිනකට පැය 03ක උපරිමයකට යටත්ව 2016 වර්ෂය සඳහා අනුමත දේශන ගාස්තු, එම ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත්ව සම්පත්දායකයින්ට ගෙවීම අනුමත කරමි.

03. එමෙන්ම ඔබ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සේවාස්ථ පුහුණු පාඨමාලා/ වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන ප්‍රධානීන්ගේ හා අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්ගේ වගකීමක් වන බැවින් එම වැඩසටහන්හි සම්පත් නිලධාරීන් සඳහා අමතර දීමනාවක් ගෙවීම අනුමත කළ නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.

04. තව ද සහාය කාර්ය මණ්ඩලය සඳහා දීමනා ගෙවීම පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ විමසා ඇති අතර එකී නිර්දේශ ලද පසු ඔබ වෙත අවසන් පිළිතුරක් යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

05. එසේම මෙම දීමනා ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ආයතනය තුළ තිබිය යුතු අතර මහා භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන නොඉල්ලිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

06. ඒ අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් මවිසින් පෙර නිකුත් කරන ලද මගේ සමාංක හා 2016.11.07, 2016.12.30 දිනැති ලිපි මෙයින් අවලංගු කරමි.

07. තව ද උක්ත කරුණට අදාළව ඔබ විසින් යොමු කර ඇති 1994 මාර්තු 15 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ 1822 අදාළ වන්නේ විදේශ මුදල් උපයෝගී කරගෙන සංවිධානය කරනු ලබන වැඩමුළු, රැස්වීම, පුහුණු වැඩසටහන්, සමුළු, සමීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා සඳහා ගෙවීම් කිරීමට පමණක් වන අතර එය මගේ සමාංක හා 2014.11.25 දිනැති ලිපිය මගින් සංශෝධනය කර ඇති බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඩී. සෝමදාස
ආයතන අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. විගණකාධිපති
2. ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - ඔබගේ අංක NSCC/3/15/AL/ii හා 2017.03.08 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.

H – May 17 – 89